# වේරගම පුඤ්චිබණ්ඩාර පඬිතුමාගේ සම්බුද්ධ චරිතය කෘතියෙහි සිතුවම් පිළිබඳ අධ්‍යයනයක්

ජී. පී. සමීර ප්‍රසංග[1]
බුද්ධික කෝනාර[2]

බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ක්ෂේත්‍ර කිහිපයක ම වර්ධනයට බලපෑවේ ය. මුද්‍රණ කර්මාන්තයේ වූ ප්‍රගතිය ඒ අතුරින් කැපී පෙනේ. මුල් අවධියේ පටන් බුදු දහමටඅදාළවිවිධ පොත් මුද්‍රණය වී තිබුණ දසිතුවම් සහිත බුද්ධ චරිතයක් දක්නට නොලැබුණේ ය. පළමු වරට සිතුවම් සහිත බුද්ධ චරිතයක් පළ කරනු ලැබුවේක්‍රි. ව. 1891 දී වේරගම පුඤ්චිබණ්ඩාර පඬිතුමා විසිනි. මේ සිතුවම්කරණය සඳහා ශිල්පීන් දෙදෙනෙකුගේ සහය එතුමාට ලැබී ඇත.එතෙක් විහාර බිතු සිතුවම් හා ප්‍රතිමාවලින් පමණක් බුද්ධ චරිතය නරඹා තිබූ බෞද්ධයින්ට බුද්ධ චරිතය කියවමින් සිතුවම් නැරඹීමේ හැකියාව මෙමගින් පළමු වරට උදා විය. මුද්‍රණ කර්මාන්තයේ පැවති සීමාවන් කෘතියෙහි සිතුවම්වලට බෙහෙවින් බලපා ඇත.සිදුහත් කුමරු දක්වන අවස්ථාවන්හි විශේෂත්වයක් නොකොට සාමාන්‍ය ළදරුවෙකුගේ ස්වරූපයෙන් දැක්වීම, සුදොවුන් රජු හා සක් දෙව්රජු අතර රූපකායමය වෙනසක් නොදැක්වීම,බුදුරදුන් දේහධාරීත්වයෙන් හා සිරස්පතය දැක්වීමෙන් පමණක් සෙසු භික්ෂු ශ්‍රාවක පිරිසෙන් වෙන් කර දැක්වීම ආදී ලක්ෂණ මුද්‍රණ තාක්ෂණයේසීමා ලෙස හඳුනා ගත හැකි වේ.කෘතියේ මානව රූප හා ඇඳුම් පැළඳුම් නිරූපණයේ දී යුරෝපීය අංග ලක්ෂණ සේම දේශීය අංග ලක්ෂණ සම්මිශ්‍රණය කර යොදා ගෙන තිබේ. දස මාර පරාජය දැක්වෙන සිතුවමෙහි මාර සේනා ඇඳ සිටිනුයේ යුරෝපා ආභාසය පෙන්වන සරුවාලයක් හා සමාන කොට කලිසමකි. සුජාතාව විසින් කිරි පිඬු පිරිනැමීමේ අවස්ථාව නිරූපණයේ දී සුජාතාවන් කුඹුරට ඇඹුල ගෙනෙන ගැමි ලියක ලෙස දේශීය මුහුණුවරින් දක්වා ඇත. සමකාලීනවපැවති පාරූපනවාදය පිළිබඳ මධ්‍යස්ථ අදහසක් වේරගම පඬිතුමා විසින් දරා තිබේ. කෘතිය ආරම්භයේ දී හෙතෙම ආයාචනා කරනුයේ සිය නිර්මාණ පාරූපනවාදය සඳහා භාවිත නොකරන ලෙසයි. වාදයට සහභාගී වූ දෙපිරිසගේ ම සහය ලබාගැනීම හා සිය මධ්‍යස්ථභාවය පෙන්වීම සඳහා උභයාංශ හා ඒකාංශ යන දෙයාකාරයෙන් ම පාරූපනය දැක්වීමට වේරගම පඬිතුමා උත්සාහ ගෙන තිබේ. දීපංකර පාද මූලය,රාහුල කුමරු දායද ඉල්ලීම ආදීඅවස්ථාවල දී බුදුරදුන්ගේ චීවරය උභයාංශ කොට දක්වා ඇත. එසේ වුවත් නන්ද කුමරුන් පැවිදි කිරීම, සුජාතාවගෙ කිරිපිඬු දානයආදී ස්ථානවල දී චීවරය ඒකාංශ කොට දක්වා තිබේ.මේ අනුව 'සම්බුද්ධ චරිතය' කෘතියෙහි එන සිතුවම් එකොළහ හුදු සිතුවම් එකතුවක් පමණක් නොව තත්කාලීන සමාජ, සංස්කෘතික හා ආගමික පසුබිම පිළිබිඹු කරන නිර්මාණ සමුදායක් ලෙස ද අගය කළ හැකිය.

**ප්‍රමුඛ පදඃ** මුද්‍රණ ශිල්පය, බුද්ධ චරිතය, පාරූපනවාදය, යුරෝපා ආභාසය, සිතුවම්

1 සහය කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
sameeraprasanga1983@gmail.com
2 පශ්චාත් උපාධි අපේක්ෂක, සිංහල අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
bnkonara@yahoo.com